# සේනානායක එජාප හා යැංකි එජාප
# (ශ්‍රී ල නි ප රැකගැනීම)

රනිල් වික්‍රමසිංහ මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රැකගැනීමට මහත් උනන්දුවක් දක්වයි. ඒ මහතාගේ උනන්දුව රට ජාතිය හා රාජ්‍ය දේපොළ හැරෙන්නට වෙනත් ඕනෑම දෙයක්, විශේෂයෙන් ම තමන්ට වගකීමක් නැති ආයතන රැකගැනීමට ය. වික්‍රමසිංහ මහතා තමන් අගමැතිව සිටි සමයෙහි දී හෝ ඇමතිවරයකු ව සිටි සමයෙහි දී හෝ රාජ්‍ය ආයතන පෞද්ගලික අංශයට ලබාදීමේ වෙස්සන්තර පිළිවෙතක් අනුගමනය කෙළේ ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රැකගැනීමට උනන්දුවක් දක්වා ඇත්තේ ඒ මහතා පමණක් නො වෙයි. ජේ. ආර්. ජයවර්ධන මහතා ද ඒ පිළිබඳ ව උනන්දුවක් දැක්වී ය. රනිල් වික්‍රමසිංහ මහතාට එක්සත් ජාතික පක්ෂය රැකගත හැකි ද යන්න ද ප්‍රශ්නයකි. ඒ ප්‍රශ්නයට අපට වෙනත් අර්ථකථනයක් ද සැපයිය හැකි ය. වික්‍රමසිංහ මහතා රකින්නට යන්නේ කිනම් එක්සත් ජාතික පක්ෂය ද? අප බොහෝ විට එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආදී නම් යොදා ගත්ත ද ඒ ඒ නමින් එක් පක්ෂයක් දිගින් දිගට ම හැඳින්වෙන්නේ යැයි සිතීම මුළාවකි. අනිත්‍ය මෙනෙහි කරන බෞද්ධයනට කිසිම නමකින් දිගින් දිගට ම හැඳින්විය හැකි වෙනස් නොවන දෙයක් පැවතිය නොහැකි වුවත් ඔවුහු ද සම්මුතියක් ලෙස යම් නමකින් හැඳින්විය හැකි දේ සම්මුති වශයෙන් ගනිති. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. එක්සත් ජාතික පක්ෂය ද එලෙස සම්මුතියෙන් කියැවෙන නම් ය.

බොහෝ දෙනා සිතන ආකාරයට එක්සත් ජාතික පක්ෂය 1946 දී පමණ ඩී. එස්. සේනානායක මහතාගේ නායකත්වයෙන් ඇරඹිණි. ඉන්පසු කලෙක ඩඩ්ලි සේනානායක මහතා, ජෝන් කොතලාවල මහතා, ජේ. ආර්. ජයවර්ධන මහතා, ආර්. ප්‍රේමදාස මහතා, රනිල් වික්‍රමසිංහ මහතා ආදීහු එහි නායකත්වයට පත්වූහ. ඒ ඒ නායකයන් යටතේ තිබී ඇත්තේ එකම එක්සත් ජාතික පක්ෂයක් යැයි ද ඔවුහු සිතති. එලෙසම බණ්ඩාරනායක මහතා 1951 දී ශ්‍රී ල නි පක්ෂය පිහිටුවූ බව ද ඒ මහතාගෙන් පසු ඒ පක්ෂයේ නායකත්වයට බණ්ඩාරනායක මැතිණිය ද, චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද පත් වී යැයි ඔවුහු විශ්වාස කරති. එහෙත් එය එසේ නොවන බව මේ තීරුවෙන් බොහෝ අවස්ථාවල පෙන්වා දී ඇත. බණ්ඩාරනායක මහතා ඇරඹූ පක්ෂය ලිබරල් පක්ෂයක් වූ බව ද එය 1955 දී පමණ රූපාන්තරකරණයකින් මෙරට ජාතිකත්වයේ පක්ෂය වූ බව ද, 1993න් පමණ පසුව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය යටතේ තවත් මහජන පක්ෂයක් බවට ද පත්වූ බවත් අප පෙන්වා දී ඇත. ඒ පක්ෂය අද නැවතත් මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් ජාතිකත්වයේ ප්‍රතිපත්ති වෙතට යමින් සිටින බව ද මේ තීරුවෙන් පෙන්වා දී ඇත. මහින්ද රාජපක්ෂ මහතා අගමැතිකමට පත්වීමට යෑමේ දී එයට විරුද්ධව හැකි සෑම දෙයක් ම කළ අයකු වූ ද, පනස්හයේ දරුවන් විශාල පිරිසක් දංගෙඩියට දැක්කවීමට කටයුතු කළාවූ ද, ශ්‍රී ල නි ප පිළිබඳ කරුණෙහිදී මෙන් ම වෙනත් කරුණුවලදී ද, අනුන්ගේ මත අහුළාගෙන වචනයක් දෙකක් මාරුකර ඒ තමන්ගේ මතයක් බව ප්‍රකාශකරමින් ජාත්‍යන්තර ජාලයක කටයුතුකරන කුප්‍රකට පුද්ගලයකු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පුනරාගමනයක් ගැන කතාකරන්නේ කිනම් අදහසකින් ද යන්න පිළිබඳව අපි දැඩි සෙවිල්ලකින් පසුවෙමු. මේ පුද්ගලයා ගැන මහින්ද රාජපක්ෂ මහතා දන්නා බැවින් ඒ ගැන එතරම් කලබල විය යුතු ද නො වෙයි. අවශ්‍ය වන්නේ අවධානයෙන් පසුවීම පමණ ය.

ශ්‍රී ල නි පක්ෂයේ (හෝ පක්ෂවල) විකාශය ගැන අප බොහෝ අවස්ථාවල සඳහන්කර ඇති නමුත් එක්සත් ජාතික පක්ෂය ගැන එවැනි විශ්ලේෂණයක් කිරීමේ අවශ්‍යතාවක් පැන නො නැගුණි. ඉඳහිට ඒ පිළිබඳ සඳහන්කර ඇත්තේ ඉතා කෙටියෙන් ය. අපට ආරම්භයේ දීම සඳහන්කළ හැකි දෙයක් නම් සේනානායක මහත්වරුන්ගේ එක්සත් ජාතික පක්ෂය, ප්‍රේමදාස මහතාගේ එක්සත් ජාතික පක්ෂයෙනුත්, ඒ දෙකම ජයවර්ධන මහතාගේ හා වික්‍රමසිංහ මහතාගේ එක්සත් ජාතික පක්ෂයෙනුත් වෙනස් බව ය. ජයවර්ධන එ ජා පක්ෂය හා වික්‍රමසිංහ එ ජා පක්ෂය අතර ද වෙනස්කම් ඇති බව වටහාගත යුතු ය. සේනානායකවරුන්ගේ එ ජා පක්ෂය, ජයවර්ධන-වික්‍රමසිංහ එ ජා පක්ෂවලින් වෙනස්වීම 1955 - 1992 ශ්‍රී ල නි පක්ෂය, 1993න් පමණ පසු ශ්‍රී ල නි පක්ෂයෙන් වෙනස්වීම වැනි ම වූ ගණයක වෙනස්වීමක් නොවුණත් එහි යම් සමාන්තර බවක් වෙයි. මේ වෙනස්කම් එකම පක්ෂයක සිදු වී යැයි කීමට නො හැකි ය. එක් පක්ෂයක් වෙනුවට වෙනත් පක්ෂයක් බිහිද වී ඇත. සේනනානායකවරුන්ගේ එ ජා පක්ෂය බ්‍රිතානි ගැති විය. ඒ බ්‍රිතානි කොන්සර්වෙටිව් පක්ෂය ආදර්ශයට ගත්තේ ය. ජයවර්ධන-වික්‍රමසිංහ එ ජා පක්ෂ ඇමරිකන් ගැති වෙයි. ඒ පක්ෂය ආදර්ශයට ගන්නේ ඇමරිකන් ලිබරල් පක්ෂය ය. ඇමරිකන් ලිබරල් පක්ෂය ද වෙනස් වී ඇත. අද එහි ඇත්තේ මූලධර්මවාදී ක්‍රිස්තියානි

© Prof. Nalin De Silva

බුෂ්ගේ ඊනියා නව්‍ය ලිබරල්වාදී පක්ෂයකි. වික්‍රමසිංහ මහතාගේ පක්ෂය මේ මූලධර්මවාදී ක්‍රිස්තියානි පක්ෂය අනුව සැකසී ඇත. සේනානායක එ ජා පක්ෂය හා වික්‍රමසිංහ එ ජා පක්ෂය අතර ඇත්තේ ඒ වෙනස පමණක් නො වෙයි.

සේනානායකවරුන්ගේ එ ජා පක්ෂයට යම් ජාතිකත්වයක් තිබුණි. ඒ පක්ෂය ලංකා ජාතික කොංග්‍රසයෙහි අනුප්‍රාප්තිකයා වුව ද, එයට කොංග්‍රසයට වඩා මඳ හෝ ජාතිකත්වයක් තිබුණි. එහෙත් ඒ මඳ ජාතිකත්වය එවකටත් පිහිටුවාගෙන තිබූ ලංකා සමසමාජ පක්ෂයෙහි විජාතිකත්වය හේතුවෙන් ප්‍රම්බා තිබුණි. ලසසප යටත්විජිත විරෝධී අරගලයක නිරත වත සිටිමුත් මතවාදී ලෙස ගත්කල විජාතික විය. සමසමාජ නායකයන් තම මතවාදය දුටුවේ ඊනියා විද්‍යාත්මක වාස්තවික දැනුමක් ලෙස ය. ඒ එකල තිබූ දැනුම අනුව ජාත්‍යන්තරවාදී දැනුමක් ද විය. ඊනියා විද්‍යාව, වාස්තවිකත්වය, යථාර්ථය (රියැලිටි), බටහිර පුස්සන්ගේ හා ඔවුන්ගේ අනුකාරකයන්ගේ අළුත්ම බයිලාව වූ වචනවලින් නොකියන යථය (රියල් -යථය දැනගන්නේ කෙසේ දැයි කියන ලෙස පශ්චාත් කෝලම්කාර නඩුකාරයන්ට, ඉතිහාස ආචාර්යවරුන්ට, සාහිත්‍ය සූරීන්ට හා එකී මෙකී සියළු පුස්සන්ට අභියෝගකරමි.) ආදිය නිර්මානාත්මක සාපේක්ෂතාවාදය හමුවේ බයිලා ම පමණක් වී තිබෙන මෙකල ද දහනවවැනි සියවසේ ජීවත්වන සමසමාජ මහාචාර්යවරු ද, අනෙක් මාක්ස්වාදී මහාචාර්යවරු ද, පශ්චාත් මාක්ස්වාදී ආචාර්යවරු ද ආදී ඇංකරයෝ ඒ ජාත්‍යන්තරවාදී මඩගොහොරුවේ ම එරී සිටිති. සමසමාජය යටත්විජිත විරෝධී අරගලයේ යෙදුණේ මාක්ස්ගේ සංස්කෘතික යටත්විජිතවාදී මතවාදවල ආධාරයෙන් ය! සමසමාජයට සාපේක්ෂව ජනතාවට එජාප ජාතිකත්වයට බෙහෙවින් නැඹුරුවිය. මේ හේතුවෙන් ද කලින් සඳහන්කරන ලද මඳ ජාතිකත්වය, එජාපක්ෂයට ජාතිකත්වයක් තිබූ සිංහල ජනතාව ආකර්ෂණය කරගැනීම සඳහා වූ ආභරණයක් විය.

සේනානායකවරු එයට කලින් සිටි කොංග්‍රස් හා අනෙක් නායකයන් මෙන් බ්‍රිතානීන් විසින් වරප්‍රසාද, තනතුරු, ඉඩකඩම් ආදිය ප්‍රදානයකර ප්‍රභූ වහළුන් ලෙස පත්කරගන්නා ලද්දෝ නොවූහ. එහෙත් ඔවුහු ද බ්‍රිතානීන් විසින් ඇතිකරන ලද යටත්විජිතවාදී ආර්ථිකය (හා අධ්‍යාපනය) ඔස්සේ ඊනියා සම්භාවනීයත්වයකට පත්වූවෝ වූහ. ඒ හේතුවෙන් ඔවුන්ට බ්‍රිතානීන් මත යැපෙන්නට විය. එහෙත් ඔවුහු මහමුදලිලා, ජයවර්ධනලා ආදීන් මෙන් බ්‍රිතානීන් විසින් කෙලින් ම ප්‍රභූ වහල් සේවයට කැඳවනු ලැබූවන් නොවූ බැවින් මඳ ජාතිකත්වයකට හිමිකම් කීවෝ ය. 1947 දී මෙන් ම 1952 දී ද පැවති මැතිවරණවලදී ජාතිකත්වයක් තිබූ අයගෙන් අති විශාල බහුතරය එජාපයට ඡන්දය දුන්නේ එබැවින් ය. මේ තත්ත්වය වෙනස්වන්නට පටන්ගත්තේ ශ්‍රීලනිප 1955 දී පමණ ජාතිකත්වයේ පක්ෂය බවට පත්වීමෙන් පසුව ය. ජයවර්ධන මහතා ජාතික ඇඳුමින් සැරසුණ ද යැංකි ඩිකී විය. ඔහු වත්මන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යනු කුමක්දැයි සේනානායකවරුන්ට වඩා හොඳින් දැනසිටියේ ය. ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව බටහිර නූතනත්වයේ නායකත්වය බ්‍රිතානියෙන් ඇමරිකාවට මාරු වී ඇති බව ඔහු තේරුම්ගෙන සිටියේ ය. ඔහුගේ නායකත්වය යටතේ එජාපක්ෂය බ්‍රිතානි කොන්සර්වේටිව් අච්චුවෙන් ඇමරිකන් ලිබරල් අච්චුවට මාරුවිය. විධායක ජනාධිපති ධුරය මගින් මේ කරුණු කුළුගන්වා ප්‍රකාශකෙරිණි. වික්‍රමසිංහ මහතා එය තවත් ඉදිරියට ගෙනගොස් ඇත. ඔහු යටතේ එජාපයට කිසිදු ජාතිකත්වයක් නැත. (ඔහුගේ ජාතිකවාදී වෙස්මුහුණ ඔහුගේ මුහුණට නොසරිලන බව වෙස්මුහුණ නිතර ම ගැලවී වැටීමෙන් පෙන්නුම් කෙරෙයි.) ඊනියා නව්‍ය ලිබරල්වාදයේ ප්‍රකාශකයා වූ ඔහුට ජාත්‍යන්තරය හා ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව හැරෙන්නට වෙන කිසිවකු නැත. පැරණි එජාපයට යම් ජාතිකත්වයක් තිබූ බැවින් ඡන්දය දුන් ජාතිහිතෛෂීන්ට අද ඡන්දයදීමට ඒ පක්ෂය නැත. අද ඇත්තේ යැංකි එජාපයකි. අර කසිකබල් ජාත්‍යන්තරවාදී පශ්චාත් කෝලමුන් බෙහෝ දෙනකු වික්‍රමසිංහ මහතා පසුපස පෙළගැසී සිටීම පුදුමයක් නො වෙයි. වික්‍රමසිංහ මහතා බලයට පත්කිරීමට රුපියල් තුන්දාහට දූප්පත් අම්මලා මුළාකරන එජාපයේ ප්‍රභූ වහළුන්, ප්‍රභූ කෝලම්යන්ට හෙවත් ඊනියා විදග්ධ සිනමා අධ්‍යක්ෂකවරියන්ට (තනිතට්ටේ ගැට්ස්සියන්ට) රුපියල් තුන්දාහට වඩා ගෙවන්නේ යැයි විශ්වාස කළ හැකි ය. තනිතට්ටේ ගැටවුන් හා ගැට්ස්සියන් බටහිර කසිකබල් මතවාදවල සිරකරුවන් බැවින් ඔවුන්ට දොස්කීම නොමනා යැයි අපි නො සිතමු. පසුගිය අවුරුදු විස්සක පමණ කාලයක් තිස්සේ මෙරට වර්ධනය වූ ජාතිකත්ව මතවාදයක් වෙයි. මේ ප්‍රභූ කෝලමුන් හා කෝලම්යන් (තනිතට්ටේ ගැටවු හා ගැට්ස්සියන් පමණක් නොව තනිතට්ටේ ආරක්ෂක දඩයක්කාරයන් ද) ඒ මතවාදයෙන් යමක් ඉගෙනගැනීම වෙනුවට කෙළේ තමන්ට නොතේරෙන ඊනියා යථයක් පසුපස සෙළුවෙන් දිවයමින් ජාතිකත්ව මතවාදය ජාතිවාදී යැයි මරලතෝනි දෙමින් ඒ මතවාදයට පහරදීම ය. පහරදීමෙන් සිදු වී ඇත්තේ ජාතිකත්ව මතවාදය ශක්තිමත් වීම ය.

© Prof. Nalin De Silva